රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 50/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1989 ඔක්තෝබර් මස 11 වැනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

**අධිකරණ නිලධරයන්/ රජයේ නිලධරයන් හා රාජ්‍ය සංස්ථා සේවකයින්ට රජයේ වාහනවල අයිතිය පැවරීම.**

1984. 08. 15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 264 හා 1988.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 6/88 හි විධිවිධාන ප්‍රකාර, රාජකාරි සහ පෞද්ගලික කාර්යයන් සඳහා රජයේ වාහන පාවිච්චි කිරීමට හිමිකම් ඇති රජයේ නිලධරයන්ට හා සංස්ථා සේවකයින්ට පහත සඳහන් කොන්දේසි යටතේ රජයේ වාහන වෙන් කිරීමේ ක්‍රමයක් පහත ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

(I) වෙන් කරන ලද වාහනය කිලෝ මීටර් ලක්ෂයක් ධාවනය කෙරෙන තුරු හෝ වසර 5 ක් සම්පූර්ණ වන තුරු හෝ රජයේ දේපළක් වශයෙන් පවතිනු ඇත.

(II) වාහනය පවරනු ලබන අවස්ථාවේදී, වාහනය මිලදී ගනු ලැබූ මුදලින් (එනම් - මිල, රක්ෂණය, නැව් ගාස්තු + පිරිවැටුම් බදු) 10% ක් නිලධාරියා විසින් රජයට ගෙවිය යුතුය.

(III) වාහනය පැදවීම, සේවා කිරීම, නඩත්තුව සහ සියළුම එදිනෙදා අළුත් වැඩියා කටයුතු නිලධාරියා විසින් කළ යුතුය. සිය වියදමින් රියදුරෙකු යොදා ගැනීමට ඔහුට/ඇයට පුළුවන. ගිවිසුම් කාලය තුළදී සියළුම අළුත් වැඩියා හා නඩත්තු බිල්පත් වලින් 5% නිලධාරියාට ගෙවනු ලැබේ.

(IV) ගිවිසුම් කාලය තුළදී බලපත්‍ර සහ රක්ෂණ වියදම් නිලධාරියා විසින් දැරිය යුතුය.

(V) රාජකාරි ගමන් බිමන් වෙනුවෙන් මාසයේ දින 22 ක් සඳහා දිනකට කිලෝ මීටර් 60 ක් (එනම්, මසකට කිලෝ මීටර් 1320 ක්) සඳහා නිලධාරියා වෙත [illegible] සපයනු ලැබේ. මෙහි උපරිම සීමාව මසකට කිලෝ මීටර් 1500 ක් ලෙස සැලකිය හැක. එසේ වුව ද මෙම ප්‍රතිපාදනයෙන් ඉතිරිවන ප්‍රමාණය පෞද්ගලික කාර්යයන් සඳහා යොදා ගත හැක.

/. . 2

(VI) අය කිරීමකින් තොරව මසකට ඉන්ධන ගැලුම් 10 ක් ලබා ගැනීමට හෝ මසකට කි. මී. 300 ක් පෞද්ගලික ධාවනය සඳහා වාහනය යොදා ගැනීමට නිලධාරියාට හැකි වේ. මෙම සීමාවන් ඉක්මවන අවස්ථාවන්හි දී ධාවන සැතපුමක් සඳහා රු. [illegible] වන පරිද්දෙන් එම වියදම් නිලධාරියා විසින් ගෙවිය යුතුය.

(VII) වාහනය නිෂ්පාදනයේ දී ඇති වූ තාක්ෂණික දෝෂයක් නිසා විශාල අලුත් වැඩියාවක් කරන්නට සිදුවන විරල අවස්ථාවකදී, එය වගකීම් සහිත කාලය තුලදී නම්, අදාල නිෂ්පාදන සමාගම විසින් එම වියදම දැරිය යුතුය. එම අවශ්‍යතාවය ක්‍රියාත්මක කිරීමේ වගකීම රජය විසින් දරනු ඇත.

(VIII) ක්‍රියාත්මකව පවතින ගිවිසුම නිමවීමට පෙර යම් නිලධාරියෙක් විශ්‍රාම යන්නේ නම්, එම වාහනයේ අයිතිය ඔහුට පැවරීමට පෙර අයකර ගතයුතු අනුපාතික මුදල් ප්‍රමාණය, සටහන් ඇති 1 වන ඇමුණුමේ තෝරාගත් යම් වාහන වර්ග සඳහා ගණනය කර ඇත. අනිකුත් වාහන වර්ග සඳහා වුවද, මුදල් අයකර ගැනීමේදී එම ක්‍රමයට අනුගමනය කළ හැක.

(IX) අවම වශයෙන් වසර 3 ක් වත් මෙම ක්‍රමය තුල රැඳී සිටීමට නිලධාරියාට හැකි වන පරිදි, මෙම ක්‍රමය වයස අවුරුදු 57 ක් හෝ ඊට අඩු වයසින් යුත නිලධාරීන්ට අදාල වේ.

(X) දැනට සිටින ආයතනයේ වසර 5 ක් නිමවීමට පෙර වෙනත් දෙපාර්තමේන්තුවකට හෝ අමාත්‍යාංශයකට හෝ ස්ථාන මාරු ලැබීමට ඉඩකඩ ඇති නිලධාරීන්ට හෝ දීඝ කාලීන අධ්‍යයන නිවාඩු ලබා එතෙර යාමට බලාපොරොත්තු වන නිලධාරීන්ට මෙම ක්‍රමයට කැමැත්ත පළ කිරීමට අනුබල දෙනු නොලැබේ.

03. මෙම ක්‍රමය නියාමක පදනමක් මත ක්‍රියාත්මක වේ. ආපසු අයකර ගැනීම් වල ප්‍රමාණය හා මෙම ක්‍රමයේ ක්‍රියාකාරිත්වය නිරන්තර පරීක්ෂණයට භාජනය කිරීමට යටත්ව, ඉහත වරප්‍රසාදය හිමි අනෙකුත් නිලධාරීන්ද ඇතුලත් වනසේ මෙම ක්‍රමය අනුක්‍රමයෙන් පුළුල් කරනු ලැබේ.

04. අමාත්‍යාංශවල ලේකම්වරුන්, රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරුන්ට හා සංස්ථා සභාපතිවරුන්ට දැනට ක්‍රියාත්මක වන වාහන වෙන් කිරීම එසේම පවතිනු ඇත. එසේ වුවත් මෙම නිලධාරීන්ට වුවද නව ක්‍රමයට තමා කැමැත්තේ නම් ඇතුලත් වීමට ඉල්ලා සිටිය හැක.

(පී. එන්. ඒ. ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

I ඇමුණුම.

නියමිත කාලයට පෙර ගිවිසුම් අවසන් කිරීමේදී නිලධාරියාගෙන් වාර්ෂිකව අයකර ගත යුතු මුදල් ප්‍රමාණය

| වැස්ඩා එල් 323 | ආපසු අයකර ගැනීමේ වාර්ෂික ප්‍රතිශතය | අයකර ගත යුතු ප්‍රමාණය |
|---|---|---|
| මිලදී ගත් මුදල (ධාවනයේදී වටිනාකම) රු. 430,000/= | 1. මිලදී ගත් මුදලින් - 85% | රු. 365,500/= |
| | 2. " " - 67% | රු. 288,100/= |
| | 3. " " - 48% | රු. 206,400/= |
| | 4. " " - 29% | රු. 124,700/= |
| | 5. " " - 10% | රු. 43,000/= |

| නිස්සාන් සනි | ආපසු අයකර ගැනීමේ වාර්ෂික ප්‍රතිශතය | අයකර ගත යුතු ප්‍රමාණය |
|---|---|---|
| මිලදී ගත් මුදල (ධාවනයේදී වටිනාකම) රු.550,000/= | 1. මිලදී ගත් මුදලින් - 85% | රු. 467,500% |
| | 2. " " - 67% | රු. 368,500% |
| | 3. " " - 48% | රු. 264,000% |
| | 4. " " - 29% | රු. 159,500% |
| | 5. " " - 10% | රු. 55,000% |

| හුන්ඩායි ස්ටෙලාර් 8.එස්.එල්. | ආපසු අයකර ගැනීමේ වාර්ෂික ප්‍රතිශතය | අයකර ගත යුතු ප්‍රමාණය |
|---|---|---|
| මිලදී ගත් මුදල (ධාවනයේදී වටිනාකම) රු.510,000/= | 1. මිලදී ගත් මුදලින් - 85% | රු. 433,500/= |
| | 2. " " - 67% | රු. 341,700/= |
| | 3. " " - 48% | රු. 244,800/= |
| | 4. " " - 29% | රු. 147,900/= |
| | 5. " " - 10% | රු. 57,000/= |